සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளிர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
Ministry of Women, Child Affairs and Social Empowerment

මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/MF/01/චක්‍රලේඛ
ඔබේ අංකය / உமது இல / Your No: ..........................
දිනය / திகதி / Date: 2022.11.15

**සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක :- 2022/13ට පළමු එකතුව**

සියළුම සමෘද්ධි බැංකු පාලක මණ්ඩල/ බැංකු සමිති විධායක කමිටු සභාපතිවරුන්,
සමෘද්ධි ප්‍රජාමූල බැංකු/ බැංකු සමිති කළමනාකරුවන්.

**<u>සමෘද්ධි බැංකු ක්ෂේත්‍ර මුදල් රැස් කිරීම සහ ක්ෂේත්‍රය තුළදී ඉතුරුම් ආපසු ගෙවීම සඳහා ජංගම දුරකථන යෙදවුම (Mobile App) හඳුන්වා දීම.</u>**

**<u>රු.500/- මාසික සන්නිවේදන ගාස්තුවක් ලබා දීම.</u>**

සමෘද්ධි බැංකුව වෙනුවෙන්, ක්ෂේත්‍රයේ සිට තැන්පතු මුදල් රැස් කිරීම සහ තැන්පතු මුදල් ආපසු ලබා දීම (withdraw) සඳහා දුරකථන යෙදවුමක් (Mobile App) සමෘද්ධි සංවර්ධන නිලධාරින්ට හඳුන්වා දීම දැනට සිදු කර ඇත.

02. මෙම දුරකථන යෙදවුම (Mobile App) භාවිතා කර, තැන්පතු මුදල් රැස් කරන සහ තැන්පතු මුදල් ආපසු ගෙවන ලබන ක්ෂේත්‍ර ගත සමෘද්ධි සංවර්ධන නිලධාරින්ට පමණක්, යෙදවුම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අන්තර්ජාල පහසුකම් සහ දුරකථන ඇමතුම් වෙනුවෙන් මාසිකව රු. 500/-ක මුදලක්, ගාස්තුවක් ලෙස ලබා දීමට 2022.11.01 දින පැවැත් වූ සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති කළමනාකරණ මණ්ඩල රැස්වීමේදී, තීරණ අංක 2022/108/04 යටතේ අනුමැතිය ලබා දී ඇත.

03. ඒ අනුව, දුරකථන යෙදවුම භාවිතා කර, තැන්පතු රැස් කරන හෝ තැන්පතු ආපසු ගෙවන නිලධාරින ගෙවනු ලැබූ පෙර ගෙවුම් (Pre Paid)/ පසු ගෙවුම් (Post Paid) බිල්පත් වල සඳහන් මුදල නොඉක්මවන පරිදි උපරිම රු. 500/- මුදලක් මාසිකව ලබා දීමට සමෘද්ධි බැංකුවට අවසරය හා අනුමැතිය ලබා දෙමි.

04. මුදල් හර පත්‍ර භාවිතා කර, <u>"වැය ගිණුම දුරකථන ගාස්තු හා අන්තර්ජාල" (කේත අංක 2116) හර</u> කර අදාල නිලධාරින්ට මුදලින් ගෙවිය යුතුය. මෙහිදී නිලධාරින් විසින් එක් එක් මාසයට අදාල බිල්පතෙහි පිටපතක් බැංකුවට ඉදිරිපත් කළ යුතුය. තවද, එක් එක් නිලධාරියාට මාසිකව ගෙවන ලද මුදල් සම්බන්ධ රෙජිස්තරයක්, පහත තොරතුරු ඇතුළත්ව බැංකුව විසින් නඩත්තු කළ යුතුය.

1. අනු අංකය
2. නිලධාරියාගේ නම
3. වසම
4. බිල්පත්වල සඳහන් මුදල (රු.)
5. ගෙවූ මුදල (රු.)
6. ගෙවූ දිනය
7. මුදල් භාරගත් බවට අත්සන
8. මුදල් ගෙවූ බවට නිලධාරි අත්සන
9. වෙනත්

05. යම් මාසයක ලබා දෙන මුදලට ප්‍රමාණවත්, තැන්පතු රැස් කර හෝ තැන්පතු ආපසු ගෙවා නැති බවට සෑහීමකට පත්වන අවස්ථාවක දීමනාව ලබා නොදීමට බැංකු පාලක මණ්ඩලයට තීරණයක් ගත හැක.

06. නිලධාරියකු ග්‍රාම නිලධාරි වසමක වැඩ බලන විටකදී, එම වසමටද මෙම දුරකථන යෙදවුම භාවිතා කරන නිලධාරින්ටද මෙම දීමනාව ලබා දීම සිදු කළ යුතුය.

07. මෙම දුරකථන දීමනාව ලබා ගැනීමට ඉදිරිපත් කරන බිල්පතට අදාල සිම්පත බැංකුව සතු වත්කමක් ලෙස සලකා කටයුතු කළ යුතුය.

08. මෙම කාර්යය සාර්ථකව ක්‍රියාත්මක කිරීමට ඔබ සහ කාර්යය මණ්ඩලය දක්වන උනන්දුව අගය කර සිටිමි.

ආර්.පී.බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:-

1. ලේකම්, කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය - කා.දැ.ස.
2. දිස්ත්‍රික් ලේකම්/ අතිරේක දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල් ,දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අ.ක.ස.
3. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අ.ක.ස
4. ප්‍රධාන අභ්‍යන්තර විගණක - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස
5. ප්‍රාදේශිය ලේකම් - ප්‍රාදේශිය ලේකම් කාර්යාලය - අ.ක.ස.
6. නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අ.ක.ස.
7. සහකාර අධ්‍යක්ෂ පරිගණක තොරතුරු තාක්ෂණ අංශය - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - අ.ක.ස.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |
| | | Hot Line :0112-889007 | | | |